
# අපූරු යාළුවෝ



වගීෂ බණ්ඩාර

# අපූරු යාලුවෝ

වගීෂ බණ්ඩාර

කතා

පළමු දිගහැරුම

මහ/ශාන්ත සිල්වෙස්තර විදුහල

3 ශ්‍රේණිය

2025.02.08

ISBN - 978-624-208-691-0

# පිදුම

පුංචි මට ශක්තියක් වූ

මහ/ශාන්ත සිල්වෙස්තර විදුහලේ

විදුහල්පතිතුමා

ඇතුලු

ගුරු මෑණිවරුන්ටත් ,පියවරුන්ටත්,

අනුරාධා නිරෝෂණි ජයසිංහ ගුරු මෑණියන්ටත්

ආදරයෙන් පුදමි.

# පෙරවදන

සාහිත්‍ය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි.ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපී පෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි. දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කර ගැනීමය අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදී කතෘ කරදන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛබ සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමු කරන හෙරණගත්කරණී ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය. මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේ ම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛණ කරණයට යොමුවීම ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,

ශශිකලා සේනාධීර,

මහමායා බාලිකා විද්‍යාලය- මහනුවර.

දවසක් දඟකාර පූස් පැටියෙක් හිටියා.එයාගේ නම ඩිංකි. ඩිංකි හරිම හොදයි. එයාට හිටියා යාලුවෙක්. ඒ තමයි කිරි. ඩිංකි ගහකට නැගලා කිරි ඉන්නවද කියලා වටපිට බැලුවා.කිරි හිටියේ නෑ.



ඩිංකි එකපාරටම දැක්කා මීමැසි පැංචට කරදයක් වෙලා. එයාගේ තටු මකුළු දැලක පැටලිලා. අනේ මට උදව් කරන්න. මී මැසි පැංචා අඬනවා. ඩිංකි දුවලා එතනට ආවා. කිරීත් දුවලා ආවා.



මී මැසි පැංචා අඬන්න එපා. අපි ඔයාව බේර ගන්නවා. ඩිංකි කිවුවා. ඩිංකියි කිරියි මකුළු ගෙය කඩන්නෙ නැතිව මී මැසි පැංචාව බේරාගන්නා. මී මැසි පැංචාට හරි සතුටුයි. පැංචා හිතුවා මමත් මගේ යාලුවන්ට

හැමවිටම උදවු කරනවා කියලා.



තවත් දවසක මී මැසි පැංචා පැණි එකතු කරනකොට ඩිංකි ගහක් මුල වැටිලා හිටියා. ''යාලුවේ ඔයාට කරදරයක්ද? ඇයි ඔයා අඩන්නේ'' මී මැසි පැංචා ඇහුවා. අනේ යාලුවේ මගෙ කකුල තුවාල වෙලා. මට කෑම සොයාගන්නත් බැරි වුණා. මට හරිම බඩගිනියි. ඩිංකි කිව්වා. කිරීටත් ඒක ඇසුණා.



යාලුවන්ට හරිම දුකයි. එයාලා දෙන්නා ඩිංකිට බෙහෙත් දැම්මා. මී මැසි පැංචා එකතු කරපු පැණි ඩිංකිට කන්න දුන්නා. කිරීත් ඉක්මනට පළතුරු ගෙනත් දුන්නා.



යාලුවෝ තුන්දෙනාම සතුටින් ගෙදර ගියා.

පුංචි අපිත් සෑමවිටම අපේ යහලුවන්ට උදව් කළ යුතුයි.

යහලුවන්ට උදව් කිරීම අපේ යුතුකමකි.

ස්තූතියි

# පසුවදන



රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මාණකරණය විහවතා කොටගත් අනාගතපරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට ඇවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායීතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සදහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහි දී මහමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පතිතුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදී ශිෂ්‍යාවන් දැක් වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය. මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමග දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මකබවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මකව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නුතන තාක්ෂණය සමග ගලපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනා කරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහමායා බාලිකාවියන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ. තම නිසග, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධිකාරක,

සෙනෙවිරත් මහලේකම්